සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

54 S I

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**First Term Test - Grade 13 - 2020**

විභාග අංකය ..................................

# පෙරදිග සංගීතය I

කාලය පැය දෙකයි

උපදෙස්

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- 1 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරාගෙන එයට හිමි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.
- 31 - 50 දක්වා උත්තර පත්‍රයේම පිළිතුරු සපයන්න.

01. නිධ, පධමග, රිගුරි යන ස්වර සංගතිය නිර්දේශිතරාගයක යෙදේ. ඒ පිළිබඳ දක්වා ඇති සත්‍ය ප්‍රකාශය තෝරන්න.

i. උදය සන්ධි ප්‍රකාශ රාගයක් වේ. ii. සන්ධ්‍යා, සන්ධි ප්‍රකාශ රාගයක්වේ.
iii. පරමේල ප්‍රවේශයක රාගයක්වේ. iv. ජායාලග් රාගයක් වේ.
v. සම්ප්‍රකෘති රාගයක් වේ. (........)

02. මප, ධුධුස්, රිංස් ලෙස යෙදෙන ස්වර කණ්ඩය අයත් රාගයට සමප්‍රකෘති රාගය වන්නේ,

i. දේස් ii. භාගේශ්‍රි iii. හංසධ්වනි
iv. ජෞනපුරි v. තිලක්කාමෝද් (........)

03. රිෂභය හා පංචමය වාදි සංවාදි වන රාග ත්‍රිත්වය ඇතුළත් පිළිතුර තෝරන්න.

i. දේශ්, ආසාවරි, ජෞනපුරි ii. තිලක්කාමෝද්, දේශ්, ආසාවරි
iii ජයපධිවන්ති, දේශ්, තිලක්කාමෝද් iv. ජයජයවන්ති, දේශ්, ආසාවරි
v. ජයජයවන්ති, තිලක්කාමෝද්, ජෞනපුරි (........)

04. නිර්දේශිත සමප්‍රකෘති රාග යුගලයක යෙදෙන ස්වර සංගතියක් ඇතුළත් වරණය තෝරන්න.

i. මපධුමපගුරිස ii. මමගුමගුගස iii ගුමධමගුරිස
iv. නිධපරිස v. රිම්පධප (........)

05. මීන්ඩ් ප්‍රධාන රාග වර්ගයට අයත් පංචමය ආගන්තුක ස්වරයක් ලෙස යොදා ගන්නා නිර්දේශිත රාගය කුමක්ද?

i. ආශාවරී ii. භාගේශ්‍රී iii ජෞනපුරි
iv. දේශ් v. ජයජයවන්ති (........)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

06. | ම – ම ප | – ප නි – | නි සං – සං | ම් ග් රි් සං | මෙම ස්වර පාදය පිළිබඳව නිවැරදි කියමනඇතුළත් වරණය කුමක්ද?

i. දේශ් රාගයේ මධ්‍යලය ගීතයේ අන්තරා කොටසට අයත් මුල් ස්වර පාදයයි.
ii. ආසාවරි රාගයේ සර්ගම් ගීතයේ අන්තරා මුල් ස්වර පාදයයි.
iii දේශ් රාගයේ මධ්‍යලය ගීතයේ ස්ථායී මුල් ස්වර පාදය යි.
iv. ජෞනපුරි රාගයේ සර්ගම් ගීතයේ ස්ථායී මුල් ස්වර පාදය යි.
v. ජය ජයවන්ති රාගයේ අන්තරා කොටසේ මුල් ස්වර පාදය යි. (........)

07. දේශ් රාගයේ අනුවාදි ස්වර සහ ගානසමය ඇතුළත් නිවැරදි පිළිතුර කුමක්ද?

i. ග ම ධ නි සං - රාත්‍රි ප්‍රථම ප්‍රහරය
ii. ග ම ධ නි සං - රාත්‍රී තුන්වන ප්‍රහාරය
iii. රි ගු ම ධ සං - රාත්‍රී දෙවන ප්‍රහරය
iv. ග ම ධ නි සං - රාත්‍රී දෙවන ප්‍රහාරය
v. ග ම ප ධ නි - රාත්‍රී දෙවන ප්‍රහරය (........)

- **අංක 8 සිට 10 තෙක් ප්‍රශ්න සඳහා පහත සටහන උපයෝගී කර ගන්න.**

| A | B | C |
|---|---|---|
| ග, ධ | ම ස | රි ප |

08. A හි සඳහන් ස්වර ආරෝහණයේ දී වර්ජිතව යෙදෙන නිර්දේශිත රාගය කුමක්ද?

i. ආසාවරි ii. ජයජයවන්ති iii. භාගේශ්‍රි iv. ජෞනපුරි v. දේශ් (........)

09. *B* හි සඳහන් ස්වර පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. භීමපලාසි රාගයේ වර්ජිත ස්වර දෙකකි.
ii. භාගේශ්‍රී රාගයේ වාදි සංවාදි ස්වර දෙකකි.
iii. ජයජයවන්ති රාගයේ විවාදි ස්වර දෙකකි.
iv. භාගේශ්‍රි රාගයේ වර්ජිත ස්වර දෙකකි.
v. ආසාවරි රාගයේ වාදි සංවාදි ස්වර දෙකකි. (........)

10. *C* හි ඇති ස්වර වාදි සංවාදි වන නිර්දේශිත රාග ත්‍රිත්වයට අදාළ පොදු ලක්ෂණය ඇතුළත් වරණය කුමක්ද?

i. රිගුරිස , නිධපරි ස්වර සංගතිය ඇතුළත් වේ.
ii. ගාන සමය රාත්‍රි දෙවන ප්‍රහරය වේ.
iii. ආරෝහණයේ ග,ධ වර්ජිත වේ.
iv. ගාන සමය රාත්‍රී ප්‍රථම ප්‍රහරය වේ.
v. ජාතිය සම්පූර්ණ සම්පූර්ණ වේ. (........)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත ස්වර ප්‍රස්තාරය උපයේගී කර ගන්න.**

| මපසං | නිධු - (ප)- | ධුධු පධු ධුප | නිනි ධුප මගු රිස |

11. ඉහත ස්වර ප්‍රස්ථාර පාදයෙන් පිළිබිඹු වන රාගය වන්නේ

i. ආසාවරී ii. දේශ් iii. තිලක්කාමෝද්
iv. භාගේශ්‍රි v. ජයජයවන්ති (........)

12. ඉහත දී ඇති ස්වර ප්‍රස්ථාර පාදයේ මාත්‍රා බෙදී ඇති පිළිවෙලට සමාන දේශීය තිත් රූපය වන්නේ,

i. සුළු මැදුම් දෙතිතයි. ii. මැදුම් තනිතිතයි. iii. මැදුම් මහ දෙතිතයි.
iv. සුළු මහ දෙතිතයි. v. මහතනිතිතයි. (........)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

13. මෙම ස්වර පාදයේ දෙවන විභාගයේ යෙදී ඇති කෝමල නිෂාධය

i. මීන්ඩ් ස්වරයකි ii. කන් ස්වරයකි iii. ගමක් ස්වරයකි
iv. වක්‍ර ස්වරයකි. v. අචල ස්වරයකි (........)

14. මෙම ස්වර පාදයේ දෙවන විභාගයේ ඇති පංචමය
i. ගමක් ස්වරයකි ii. මූර්කි ස්වරයකි iii. ආන්දෝලිත ස්වරයකි
iv. විකෘති ස්වරයකි v. විවාදි ස්වරයකි (........)

15. ඉහත ස්වර ප්‍රස්ථාර පාදයේ අවසානයේ ඇති තානාලංකාරය ගැයිය හැකි සුදුසුම තානාලංකාර වර්ගය වන්නේ,

i. සපට් තානාලංකාරයක් ලෙසය ii. අලංකාරික තානාලංකාරයක් ලෙසය
iii. කූට තානාලංකාරයක් ලෙසය iv. ගමක් තානාලංකාරයක් ලෙසය
v. බෝල් තානාලංකාරයක් ලෙසය (........)

16. සන්ධි ප්‍රකාශ රාගයන්හි ගානසමය තීරණය කිරීමට බලපාන ස්වරය ''සමය දර්ශක'' ස්වරය නමින්ද හඳුන්වයි. එම ස්වරය ඇතුලත් වරණය තෝරන්න.

i. පංචමයයි ii. මධ්‍යමයයි iii. නිෂාධයයි iv. රිෂභයයි v. ධෛවතයයි (........)

17. රාගධාරි මධ්‍යලය ගීතයක මධ්‍යයේ ගයනු ලබන ආලාප

i. අන්තරා ආලාප නම් වේ. ii. අකාර් ආලාප නම් වේ. iii. පූර්වාලාප වේ.
iv. සථායි අලාප වේ. v. මධ්‍යාලාප වේ. (........)

- **අංක 18 සිට 20 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයිමට පහත වගුව ඇසුරු කරගන්න.**

| ග්‍රන්ථය | කතුවරයා |
|---|---|
| 1. සිංහල ගැමි නාටකය | A |
| 2. B | සී.ද.එස්.කුලතිලක |
| 3. භාවික ගීත | C |
| 4. හෙළ ගී මග | D |
| 5. E | සී.ද.එස්.කුලතිලක |

18. A හා B අක්ෂරයන්ට අදාල පිළිතුර පිළිවෙලින් ඇතුලත් වරණය තෝරන්න

i. W.B.මකුලොලුව මහතා - එදිරිවීර සරත්චන්ද්‍ර මහතා
ii. එදිරිවීර සරත්චන්ද්‍ර මහතා - ලයනල් අල්ගම මහතා
iii. එදිරිවීර සරත්චන්ද්‍ර මහතා - W.B.මකුලොලුව මහතා
iv. ලයනල් අල්ගම මහතා - W.B.මකුලොලුව මහතා
v. එදිරිවීර සරත්චන්ද්‍ර මහතා - සී.ද.එස් කුලතිලක මහතා (........)

19. '' මහනුවර යුගයේ සංගීත විකාශය'' හා ''ලෝක සංගීත පද්ධති'' පිළිබඳ අධ්‍යනයේදී B සහ E අක්ෂර වලින් දැක්වෙන ග්‍රන්ථ වැදගත් වේ. එම ග්‍රන්ථ දෙක ඇතුලත් නිවැරදි වරණය තෝරන්න.

i. සංගීත සංහිතා - ඛ්‍යාල ගීත ii.විශ්ව සංගීත ක්ෂේත්‍ර - ලංකාවේ සංගීත සම්භවය
iii. හෙළගී මග - සම්භාව්‍ය සංගීත ප්‍රවේශිකා iv. ශිෂ්ට ගීත - අභිනව මූලික ගීත
v. ජන සංගීත සිද්ධාන්ත - රාග ශික්ෂා (........)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP - EXAM

20. C අක්ෂරය සඳහන් තීරුවේ ග්‍රන්ථ කතුවරයා වන්නේ,

i. විශාරද වින්සන්ට් සෝමපාල මහතා ii. ශාන්ති ගීත දේව මහතා

iii. ආනන්ද ජයසිංහ මහතා iv. W.B.මකුලොලුව මහතා

v. ජයන්ත අරවින්ද මහතා (........)

21. ශාස්ත්‍රීය තබ්ලා වාදනයක සහ රාගධාරී ශාස්ත්‍රීය සිතාර් වාදනයක යන අංශ දෙකටම පොදු වූ ශිල්ප ක්‍රම ඇතුලත් වරණය තෝරන්න.

i. මුඛඩා, ජලා, තිහායි ii. රේලා, මුඛඩා, ජාලා iii. රේලා, ජලා, තිහායි

iv. චක්‍රදාර්, තිහායි, ජලා v. තිහායි, මුඛඩා, චක්‍රදාර් (........)

22. චතුරංග නම් ගායන ශෛලියෙහි අඩංගු නොවන කොටසකි

i. තරාණා ii. සර්ගම් iii. තිර්වට් iv. ගසල් v. ඛ්‍යාල් (........)

- **ප්‍රශ්න අංක 23 සිට 25 දක්වා ප්‍රශ්නවල දී ඇති ගී පද ඇසුරින් පිළිතුරු සපයන්න**

A - බානු සේගී මාසඳ දෙය - හානු සේගී මා

B -ගුණ දැනේ බෝසත් අනේ

C - අන්ද්‍ර ගුවන් හැර නැංග අසුන් පිට

D - එර්දි වෙලා උඩුගුවනේ වඩින්නේ

E - පුරණ සමුදුර දුවන නැව් දැකලා

23. මහනුවර යුගයේ බහුල වශයෙන් පැතිරීගිය ගී වර්ග දෙකක් සඳහන් වන අක්ෂර තෝරන්න

i. A හා B ii. B හා D iii. A හා E iv. C හා D v. E හා B (........)

24. පහතරට බෙරය භාවිත කරමින් ගැයිය හැකි ගී පාදය ඇතුලත් අක්ෂරය කුමක්ද?

i. A ii. D iii. E iv. C v. B (........)

25. A, B, E අක්ෂර තුනට අයත් ගී වර්ග පිළිවෙලින් ඇතුලත් වරණය තෝරන්න.

i. මුද්‍රපද ප්‍රශස්ති, හටන් ගී, ශාන්තිකර්ම ගී

ii. ශාන්තිකර්ම, හටන් ගී, විරහ ගී

iii. විරහ ගී, ශාන්තිකර්ම ගී, ප්‍රශස්ති ගී

iv. මුද්‍රපද ප්‍රශස්ති, හටන්ගී, වන්නම්

v. මුද්‍රපද ප්‍රශස්ති, ශාන්තිකර්ම ගී, හටන් ගී (........)

26. කර්ණාටක සංගීතය සම්බන්ධ වැදගත් කෘතියක් වන ස්වර මේලකලානිධි නම් ග්‍රන්ථයේ කතුවරයා වන්නේ,

i. භාත්කණ්ඩෙ පඬිතුමා ii. රමාමාත්‍ය පඬිතුමා iii. භරතමුණි පඬිතුමා

iv. ව්‍යංඛටමුකි පඬිතුමා v. සාරංගදේව පඬිතුමා (........)

27. භාගේශ්‍රී රාගය ගායනය/වාදනය සඳහා ශ්‍රැති වාද්‍ය භාණ්ඩය හැටියට තාම්පුරාවේ තත් 4 සුසර කළ යුතු නිවැරදි පිළිවෙල වන්නේ,

i. ප ස ස ස̣ ii. ම̣ ස ප ස̣ iii. ම̣ ස ස ස̣

iv. ම ස ම̣ ස̣ v. නි̣ ස ස ස̣ (........)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

AWP - EXAM

28. C major$^{7th}$ කෝඩ් එකට අයත් ස්වර වලින් මුල් ස්වරය අත්හල විට ලැබෙනුයේ,

i. E major　　ii. E major$^{7th}$　　iii. G minor

iv. C minor$^{7th}$　　v. E minor　　(........)

29. භාරතීය සංගීත ස්වර විකාශය හා බැඳි වේද ග්‍රන්ථය වන්නේ,

i. සාම වේදයයි　　ii. යජූර් වේදයයි　　iii. අතර්වන් වේදයයි

iv. අයුර්වේදයයි　　v. ඍජ් වේදයයි　　(........)

30. 'ජවාරි' නිසි පරිදි පිහිටුවා නොගැනීමෙන් නාදයේ ගුණාත්මක බව හීනවන සංගීත භාණ්ඩය කුමක් ද?

i. සන්තූර්ය　　ii. ගිටාරය　　iii. සිතාරය　　iv. වයලීනය　　v. දිල් රුබාව

(........)

- **අංක 31 සිට 35 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් ඡේදය උපයෝගි කරගන්න.**

විවිධ ප්‍රසංගයකදි සුගන්‍යා ශිෂ්‍යාව ඉදිරිපත් කළ ශාස්ත්‍රිය ගායන අංගය තුල පැවති සුවිශේෂතා කිහිපයක් මෙලෙස දැක්විය හැකිය. ඇය තෝරාගත් රාගයේ ආරෝහණ ස්වර ගැයීමේදි කෝමල ගාන්ධර්ය හා කෝමල නිෂාධය යොදා නොගන්නා ලදී. ගීතය මධ්‍යයේදි එම ගීතයේම වචන යොදාගනිමින් අලාප ගායනයක්ද කළ අතර තානාලංකාර ගැයීමෙන් අනතුරුව එක් ආවර්ථයක් මප ධ̲ධ̲ මප ස්+ ස්+ මප ධ̲ධ̲ මප ස්+ ස්+ මප ධ̲ධ̲ මප ස්+ ස් (X) යන ස්වර ඛණ්ඩය ගයා සමස්ථානයෙන් අවසන් කරනලදී. දෙවනුව ඇය ගයන ලද්දේ විභාගයන් හි මාත්‍රා බෙදීම විෂමව යෙදෙන ගාම්භීර ගායන ශෛලියේ එන ගීතයක් වීම විශේෂ ලක්ෂණයකි. ගීතයේ ස්ථායී කොටස සමගුණයෙන් ගැයීමෙන් පසු එම කොටසම සිව්ගුණයෙන් යුතුවද ගයා සම්‍යස්ථානයෙන් අවසන් කරන ලදී.

31. සුගන්‍යා විසින් ශාස්ත්‍රිය ගායනයට තෝරාගත් රාගය කුමක්ද?

..................................................................................

32. ඇය විසින් පළමු ගායනය ලෙස ඉදිරිපත් කල ගීතයේ හින්දුස්ථානි තාලය කුමක්ද?

..................................................................................

33. සුගන්‍යා ගායනය කළ තානාලංකාරය අවසන් කිරීමට භාවිතා කළ හින්දුස්ථානි ගායන ශිල්ප ක්‍රමය නම් කරන්න.

..................................................................................

34. ඇය ගායනය කළ තානාලංකාරය අවසන් කිරීමට යොදාගත් ඉහත දක්වා ඇති ස්වරකොටසම තවත් තාලයක ආවර්ථ දෙකක් තුල ගායනය කර සමස්ථානයට පැමිණිය හැකිය. එම තාලය නම් කරන්න.

..................................................................................

35. ඇය දෙවනුව ගායනය කළ හින්දුස්ථානි ගායන ශෛලිය හා එම ගායන ශෛලියට තාලය වාදනය කිරීමට සුදුසු හින්දුස්ථානි තාල වාද්‍ය භාණ්ඩය නම් කරන්න.

..................................................................................

36. සැවුලා වන්නම .................................................... සම්ප්‍රදායට අයත් වන අතර එය ................................................ තිතට අනුව ගායනය කරනු ලබයි.

37. මහනුවර යුගයේ රාජ සභා සංගීත කණ්ඩායම් අතර විදේශීය සංගීත භාණ්ඩ පරිහරණය කළ අංශය ....................................... නමින්ද දේශීය සංගීත භාණ්ඩ පරිහරණය කළ අංශය ........................................... නමින්ද හැඳින්වීය.

NWP - EXAM



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

38. තාලයේ තාල පදය ............................................ නමින් හඳුන්වන අතර ආවර්ථ එකකට සීමාවන මූලික හස්ත සාධන අභ්‍යාස පද කොටස ................................................ නමින්ද හැඳින්වේ.

39. මොලයෙන් ස්නායු දිගේ එවනු ලබන පණිවිඩ අනුව ස්වර තන්තු තද කිරිම හෝ ඉහිල් කිරීම සිදුවනුයේ ............................................. සහ ............................................................ තන්තු මගිනි.

40. ධ්‍රැපද් ගායන ශෛලියේ ආරම්භකයා ....................................................... පඬිතුමා වන අතර බෘහද්දේශි ප්‍රධාන ග්‍රන්ථය රචනා කරන ලද්දේ ............................................................... පඬිවරයා.

41. කර්ණාට සංගීත පද්ධතියේ ප්‍රධාන මේල සංඛ්‍යාව ................................................ ක් වන අතර හින්දුසථානි සංගීත පද්ධතියේ ප්‍රධාන මේල සංඛ්‍යාව ................................................කි.

42. සොකරි ගැමි නාටකයේ විශේෂ ලක්ෂණ 02ක් වන්නේ .......................................................... මධ්‍යයෙන් කථාවක් කීම හා ........................................................ රංග භූමිය ලෙස යොදා ගැනීමයි.

43. දෙවියන් කරා ළඟාවිය හැකි සංගීත ක්‍රමය ........................................................ ය බවත් සාමාන්‍ය ජනයා අතර පවතින සංගීතය ................................................ බවත් කියැවේ.

44. A minor Scale යට .................................................... යන ස්වර අයත් වන අතර A minor chord එකට අයත් ස්වර වන්නේ ..................................................... ස්වරයි.

45. සබරගමු වන්නමක ............................................... තානම, කවිය, ...................................................... අඩව්ව ලෙස කොටස් 05 ක් වේ.

46. වේද ගායනාවන්හි සඳහන්ව ඇති නාද ස්ථාන අතර උස් වූ හඬ ........................................................... ලෙසත් පහත්වූ හඬ ......................................................... ලෙසත් දක්වා ඇත.

47. බටහිර සංගීතයේ දෙදෙනෙකු අතර සිදුකරන වාදන ප්‍රයෝගය .................................................. නමින්ද තිදෙනෙකු අතර සිදුවන වාදනය ................................................ නමින්ද හැඳින්වේ.

48. ''නංගිට බැඳපු මල් වියනයි'' යන නූතන සරල ගීතය ................................................ ආශ්‍රයෙන් නිර්මාණය වී ඇති අතර 'හංසරාජනි' ගීතය ............................................................ ආශ්‍රයෙන් නිර්මාණය වී ඇත.

49. දිවා දෙවන ප්‍රහරයේ ගැසෙන ................................... රාගය සහ ......................................... යන රාග යුගලය සමප්‍රකෘති මෙන්ම ....................................................... වාදී රාගද වන්නේය.

50. පරිඝණකය ඇසුරින් සංගීතය පටිගත කිරීමට ............................................................ නම් මෘදුකාංගයත් සංගීත නිර්මාණය කිරීමට ................................................ නම් මෘදුකාංගයත් භාවිත කළ හැකිය.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

**54 | S | II**

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**First Term Test - Grade 13 - 2020**

විභාග අංකය ..................................

# පෙරදිග සංගීතය II

කාලය පැය තුනයි

වැදගත්

I කොටසින් ප්‍රශ්න දෙකකට ද II කොටසින් ප්‍රශ්න එකකට ද III වන කොටසින් ප්‍රශ්න දෙකකට ද ආදී වශයෙන් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් ලැබේ.

## <u>I කොටස</u>

01. පහත සඳහන් ස්වර සංගති උපයෝගි කරගනිමින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A. රිගමප ගම.........රිස

B. සනිධ̣නි̣සමගු̣ ..........රිස

C. මපධු̣ස්ධු̣ප.........රිං̇ස̇

D. රිගම ප මග..........නි̣ස

| | | | |
|---|---|---|---|
| රිග | පගු | මගු | රිගු |

i. ඉහත දැක්වෙන ස්වර සංගති හතරෙහි හිස්තැන්වලට අදාල ස්වර, දී ඇති වගුව තුලින් තෝරා හිස්තැන් පුරවන්න. A, B, C, D රාග පිළිවෙලින් නම් කරන්න. (ල. 08)

ii. C හි සඳහන් රාගයට සම්ප්‍රකෘති රාගය නම්කර එම රාග දෙකෙහි සමානතා 04ක් උදාහරණ සමඟ ලියන්න. (ල. 04)

iii. A, B, D රාගවලින් එකකට අයත් මධ්‍යලය ගීතයක හෝ වාදිතයක හෝ ස්ථායි කොටස ස්වර ප්‍රස්ථාර කර ඊට අදාලව මාත්‍රා 16 තානාලංකාරයක් ලියන්න. (ල. 08)

02. නිර්දේශිත රාග කිහිපයකට අදාල තොරතුරු සමූහයක් පහත දැක්වේ.

A බමාජ් මේලගත ෂාඩව සම්පූර්ණ රාගයකි.

B ධු̱ ගු̱ වාදි සංවාදි වන ෂාඩව සම්පූර්ණ රාගයකි.

C මා, ස වාදී, සංවාදි වන රි,ප ස්වර වර්ජිත රාගයකි.

D බමාජ් මේලගත සම්පූර්ණ ජාති, අවරෝහණයේ කෝමල ගාන්ධාරය (ගු̱) සහ කෝමල නිෂාධය (නි̱) යෙදෙන රාගයකි.

i. ඉහත සඳහන් A, B, C, D අක්ෂර වලින් දක්වා ඇති තොරතුරු කිනම් රාගවලට අදාලදැයි ඉංග්‍රීසි අක්ෂරයද සමඟ නම් කරන්න. (ල. 08 )

ii. B රාගයට අදාල මේලය ආරෝහණ ස්වර, මුඛ්‍යාංගය, ගායනසමය අනුවාදි ස්වර, අවරෝහණ ස්වර, ලියා දක්වන්න. (ල. 03)

iii. D රාගයට අදාලව ස්වර 25කට නොඅඩු ආලාප බණ්ඩයක් ලියන්න. (ල. 05)

iv. A රාගයට සමප්‍රකෘති රාගය නම්කර C රාගයට අදාලව ඔබ උගත් තරාණා ගීතයක සථායි කොටස ප්‍රස්ථාර කරන්න. (ල. 04)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

NWP-EXAM

03.

| රාගාශ්‍රිත ගීතය | රාගය | ගායනය | අනුගත තාලය | විශේෂතා/ රාගධාරි අංග/ ගායන වාදන ශෛලීන් |
|---|---|---|---|---|
| මාරම්බරී | A | එඩ්වඩ් ජයකොඩි | ත්‍රිතාල්/කෙහෙර්වා අනුගතව | ගසල් ගායන ශෛලිය අලාප/තනාලංකාර |
| B | මාලකෞන්ස් | C | ත්‍රිතාලය | D |
| E | හංසධ්වනි | පී.වී.නන්දසිරි | F | G |
| හෝපලුවන පෙත | H | I | ත්‍රිතාල් අනුගතව | J |
| K | දරබාරි කානඩා | සුජාතා අත්තනායක | L | ආරම්භය අලාප ආලගායනය භජන් ශෛලිය |
| M | පීළු | N | කෙහෙර්වා/ත්‍රිතාල් අනුගත | ආලාප/තානාලංකාර සරල ශාස්ත්‍රීය |
| වස්දඩුරාවේ | O | P | ත්‍රිතාල්/අනුගතව කෙහෙර්වා | ධුම්රි ශෛලිය සරල ශාස්ත්‍රීය |

i. ඉහත වගුවෙහි හිස්තැනට සුදුසු පිළිතුර ඉංග්‍රීසි අක්ෂරය යොදා ඊට ඉදිරියෙන් ලියන්න (ල. 04 )

ii. ඉහත වගුවෙහි සඳහන් සරල ශාස්ත්‍රීය රාගාශ්‍රිත ගීත අතරින් ඔබ කැමති ගීතයක් තෝරාගෙන ''සරල ශාස්ත්‍රීය ගීතයේ රාගධාරි පසුබිම'' යන මැයෙන් බිත්ති පුවත් පතකට සුදුසු ලිපියක් සකස් කරන්න. (ල. 06)

## <u>II කොටස</u>

04. භාරතීය සංගීතයේ විවිධ ගායන ශෛලීන් පිළිබඳව දැනුවත් වීම සංගීතය හදාරන සිසුන්ට ඉතාම වැදගත්වේ.

i. ධ්‍රැපද්-ධමාර් ගායන ශෛලීන් පිළිබඳව හෝ ඛ්‍යාල් - තරාණා ගායන ශෛලීන් පිළිබඳව සන්සන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ල. 06)

ii. ධ්‍රැපද්-ධමාර් ගායන ශෛලීන් වලදී වාදනය කරන තාල දෙක නම් කර ඉන් එක් තාලයක් සමගුණ හා දෙගුණ වශයෙන් ප්‍රස්ථාර කරන්න. (ල. 06)

iii. ධ්‍රැපද් ගායන ශෛලිය සඳහා යොදාගන්නා තාලයේ මාත්‍රාගණනට සමාන වෙනත් හින්දුස්ථානි තාලයක් නම්කර එම තාල දෙක පිළිබඳ සම විෂමතා 4ක් සඳහන් කරන්න. (ල. 08)

05. පහත සඳහන් මාතෘකා 04ක් පිළිබඳව උදාහරණ සහිතව කෙටි සටහන් ලියන්න. (එක් මාතෘකාවක් සඳහා සුවිශේෂ කරුණු 05ක් වත් අන්තර්ගත විය යුතුයි)

i. බටහිර සංගීත භාණ්ඩ වර්ගීකරණය
ii. රාග ගායන සමය
iii. ශාස්ත්‍රීය සංගීතය ප්‍රායෝගික භාවිතයේදී ස්වරාලය සහ කර්ණේන්ද්‍රියෙහි වැදගත්ම
iv. ඔපෙරා සහ බැලේ නාට්‍ය සංගීතය
v. දේශීය තාල පද්ධතිය ගොඩනැගෙන අයුරු
vi. ශාස්ත්‍රීය තබ්ලා වාදනයක ඇතුලත් අංග 5ක් (ල. 20)

(5x4=20)


NWP EXAM





මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

## III කොටස

06. ප්‍රචලිත රංග සම්ප්‍රදායන් තුනක භාවිතා කරනු ලබන අවනද්ධ වාද්‍ය භාණ්ඩ තුනක රූප සටහන් පහත දැක්වේ.


A


B


C

i. ඉහත අවනද්ධ වාද්‍ය භාණ්ඩ අදාල ඉංග්‍රීසි අක්ෂරයද සමග නම් කර එම භාණ්ඩ භාවිත කරනු ලබන ප්‍රචලිත රංග සම්ප්‍රදායන් තුන නම් කරන්න. (ල.06)

ii. ඔබ නම් කළ රංග සම්ප්‍රදායන්ගෙන් දෙකක් තෝරා ගෙන කරුණු 04ක්වත් ඇතුලත් වනසේ සංගීතමය ලක්ෂණ, රංගන ශෛලිය හා සංස්කෘතික ලක්ෂණ යන ශීර්ෂ යටතේ සන්සන්දනාත්ම විග්‍රහයක් කරන්න. (ල.08)

iii. ඉහත රංග සම්ප්‍රදායන් අතරින් ඔබ තෝරා නොගත් රංග සම්ප්‍රදායේ එන ගීතයක ස්ථායී කොටස ලියා දක්වන්න. (ල. 06)

07. තනුව රිද්මය ලය අනුව ද නිර්මාණය වී ඇති ගැමි ගී වර්ගීකරණයක් කළ හැකියි. රිද්මය අනුව ආඝාතාත්මක ගැමි ගී අනාඝාතාත්මක ගැමි ගී වශයෙන් වර්ග දෙකකටද බෙදිය හැකිය.

i. ආඝාතාත්මක ගැමි ගී සහ අනාඝාතාත්මක ගැමි ගී යනු මොනවාදැයි උදාහරණ සමග කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 04)

ii. බෙහොමයක් ගැමිගී ඒකලව ගයනා වන අතර අනාඝාතාත්මක ස්වරූපයෙන්ද ගායනා කර ඇත. එසේ වීමට හේතු මොනවාදැයි කෙටියෙන් ලියන්න. (ල. 04)

iii. ගැමි ගී, සේගීවලින් වෙන්කොට දැක්විය හැකි අයුරු සන්සන්දනාත්මක විග්‍රහයක් කරන්න. (කරුණු 4ක්වත් ඇතුලත් වනසේ) (ල. 05)

iv. දාර්ශනික බව පෙන්නුම් කරන අවස්ථා සහ සාමූහික බව දනවන අවස්ථා පිළිඹිබු වන ගැමි ගී දෙක බැගින් නිදසුනට ගනිමින් කෙටි පැහැදිලි කිරීමක් කරන්න. (ල. 04)

08.




i. ඉහත සඳහන් ප්‍රස්ථාරයට අයත් ස්කේලය නම් කරන්න (ල. 04)

ඉහත බටහිර ස්වර ප්‍රස්ථාරය මධ්‍යම භාවයෙන් (Fmajor Scale) බටහිර රේඛා මණ්ඩලය මත නැවත ප්‍රස්ථාර කරන්න. (ල. 05)

ii. ඉහත ප්‍රස්ථාරයේ 1 සිට 5 දක්වා අංකනය කර ඇති සංකේත නම් කරන්න. (ල. 05)

iv බටහිර සංගීත ප්‍රස්ථාර කරණයේ එන, Tie note, Time signature, Minim Rest mark, Dotted Minim යන සංකේත ඇඳ දක්වා කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 08)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

## පළමු වාර පරීක්ෂණය 2020 - පෙරදිග සංගීතය 13 ශ්‍රේණිය

## පිළිතුරු

### I පත්‍රය

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | III | 11. | I | 21. | V |
| 2. | IV | 12. | III | 22. | V |
| 3. | III | 13. | II | 23. | V |
| 4. | I | 14. | II | 24. | II |
| 5. | II | 15. | IV | 25. | V |
| 6. | I | 16. | II | 26. | II |
| 7. | IV | 17. | V | 27. | III |
| 8. | I | 18. | III | 28. | V |
| 9. | II | 19. | II | 29. | I |
| 10. | II | 20. | I | 30. | III |

31. ආසාවරි
32. දීප්චන්දි තාලය
33. තිහායි
34. රූපක් තාලය
35. පබ්වාජ්
36. උඩරට නැටුම්/ සුළු මැදුම් දෙතිත
37. තම්බෝරු පුරප්පෙට්ටුකාර/ සිංහාරක්කාර අංශය
38. ඨේකාව/ කායදා
39. කාටිලේජය/ වෙස්ටිබියුලර්තන්තු
40. රාජා මාන්සිංග්තෝමර්/තාන්සේන්/ මාතාංග පඬිතුමා
41. 72/10 කි
42. අනුරූපන මාධ්‍යයෙන්/කමත
43. මාර්ග සංගීතය/දේශීය සංගීතය
44. ධ නි සරිගමපධ හෝ A B C D E F G A/ ධ ස ග හෝ A C E
45. දවුල් පදය/ තීරුමානව හෝ කලාසම
46. උදාත්ත/අනුදත්ත
47. යුගල වාදන හෝ Duart/ ත්‍රිත්ව වාදන හෝ Quintet
48. වැදි ගී/ මාලකෞන්ස් රාගය
49. ආසාවරි, ජෞනපුරි / උත්තරාංගවාදි හෝ ධු
50. (නුවෙන්ඩෝ) Nuendo /(රීසන්බ්

- **එක් පිළිතුරකට ලකුණු 02 බැගින් (ලකුණු 2x50=100)**

## පළමු වාර පරීක්ෂණය - පෙරදිග සංගීතය 13 ශ්‍රේණිය

### II පත්‍රය

- **I, II, III කොටස් වලින් ප්‍රශ්න තෝරා ගැනීම නිවැරදි විය යුතුය.**

01. i රිගමප ගමරිගුරිස - ජය ජය වන්ති රාගය

සනිධුනිසමගු මගුරිස - හගේශ්‍රි රාගය

මපධුස්ධුප පග්රිස් - ආසාවරි රාගය

රිගමප මග රිගනිස - දේශ් රාගය (ල. 08)

ii. ආසාවරි - ජෞනපුරි

සමානතා

- අවරෝහණ ස්වර සමාන වේ.
- මේලය සමාන වේ.
- වාදි ස්වර සංවාදි ස්වර සමාන වේ.
- රාග දෙකම උත්තරාංගවාදි රාගවේ ආදී

වශයෙන් සමානතා 04ක් ලියා ඇතිවිට ලකුණු 04යි.

iii. රාගවලින් එකක මධ්‍ය ලය හෝ වාදිනයක සථායි කොටස ලිවීමට හා මාත්‍රා 16 තානාලංකාරය ලිවීමට (ල. 08)

ස්වර සංඥා තාල සංඥා නිවැරදිව නැත්නම් ලකුණු 01ක් අඩුකරන්න.

02. i I A තිලක්කාමෝද රාගය B ජෞනපුරි රාගය

C මාලංකෞන්ස් රාගය D ජය ජයවන්ති රාගය ආදි වශයෙන් නිවැරදිව නම් කර ඇත්නම්

(ලකුණු 06 යි )

(2x4=08 )



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

ii. B රාගයට අදාලව මේලය - ආසාවරි
    ආරෝහණ - සරිමපධුනිස්
    මුඛසංගය - මපනිධපමපගුරිමප
    ගායන සමය - දිවා දෙවන ප්‍රහරය (ලකුණු 1/2x6=03)
    අනුවාදි ස්වර - ස රි ම ප නි
    අවරෝහණ - ස්නිධුපමගුරිස

iii. ස්වර 25 කට නොඅඩු ආලාප ඛණ්ඩයට (ල. 04)
    (නිවැරදි ස්වර සංඥා නොමැති නම් ලකුණු 01 අඩු කරන්න)

iv. සමප්‍රකෘති රාගය නම් කිරීමට (ල. 01)
    ගීතයේ සථායි කොටස ලිවීමට (ල. 04)

03. i. A- තිලක්කාමොද් B - හංසරාජනි C - සුනිල් එදිරිසිංහ
    D - තානාලංකාර/ ආලාප/ තබ්ලා බෝල් E - කමලාසනි
    F - ත්‍රිතාලය/කෙහෙර්වා G - ආලාප/ තානාලංකාර/තබ්ලා පද
    H - භාගේශ්‍රී I - වික්ටර් රත්නායක
    J - තානාලංකාර/ තබ්ලා පද/ ආලාප K - මමදෙව්දුනිදෙවොලට ආවේ
    L - කෙහෙර්වා M - මුව මුක්තාලතා
    N - එඩ්වඩ් ජයකොඩි O - ශිවරංජනි
    P - අමරා ගුණතුංග පිළිතුරකට 1/2 බැගින් (1/2x16=08)

ii. උදාහරණ සහිතව කරුණු ලියා ඇති විට ලකුණු ලබාදෙන්න (ල. 12)

04. i. දී ඇති මාතෘකා දෙකක් පිළිබඳව සන්සන්දනාත්මකව විස්තර ලියා ඇතිවිට (ල. 06)
    ii. තාල නම්කිරීමට (ල. 02)
    සමගුණ හා දෙගුණ ලවීමට (ල. 04)
    iii. තාලය නම් කිරීමට (ල. 02)
    සම විෂමතා 04ක් ලිවීමට (ල. 06)

05. උදාහරණ සහිතව කරුණු ගලපා ඇත්නම් ලකුණු 20 යි
    එක් මාතෘකාවකට ලකුණු 05 (5 x4 =20)

06. i. A- තබ්ලාව-නුර්නි B - ගැටබෙරය-සොකරි
    C- මද්දලය-නාඩගම් (ල. 06 2x3=06)
    ii. දී ඇති ශිර්ෂ යටතේ සංසන්දනාත්මකව කරුණු ගලපා ඇත්නම් (උදාහරණ සහිතව) කරුණු 04 (ල. 08 යි)
    iii. ගීතයක සථායි කොටස ලිවීමට (ල. 06)
    නිවැරදිව ලියා ඇතිවිට ලකුණු පිරිනමන්න

07. i. උදාහරණය සහිතව කරුණු දක්වා ඇත්නම් ලකුණු පිරිනමන්න (ල. 04)
    ii. කෙටියෙන් පැහැදිලිකර ඇත්නම් (ල. 04)
    iii. සන්සන්දනාත්මක විස්තර කර ඇතිවිට (ල. 04)
    iv. නිදසුන් සහිතව විස්තර කර ඇති විට (ල. 04)

08. i. ස්කේලය නම් කිරීමට (ල. 02)
    ii. මධ්‍යම භාවයෙන් නැවත ප්‍රස්ථාර කිරීමට (ල. 05)
    iii. අංකනය කර ඇති සංකේත නිවැරදිව නම් කිරීමට (ල. 05)
    iv. සංකේත ඇද කෙටියෙන් හැඳින්වීමට (ල. 08)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

WWW.LOL.LK

# BUY

## PAST PAPERS

## 071 777 4440

Buy Online - www.LOL.lk

- GCE O/L
- GCE A/L
- PAST PAPERS
- SHORT NOTES



Protect Yourself From Coronavirus

# YOU STAY AT HOME




# WE DELIVER!

**ORDER NOW**

**075 699 9990**

**WWW.LOL.LK**

LOL.lk
Learn Ordinary Level

**TOP CATEGORIES**

- GCE O/L Exam NEW
- Grade 09, 10 & 11
- Grade 06, 07 & 08
- Grade 04 & 05
- Grade 01, 02 & 03
- About Us
- Shop HOT
- Cart

**HUGE SALE – SHOP NOW**




**ISLANDWIDE DELIVERY**
Free delivery on all orders over Rs. 3500

**More than 1000+ Papers**
For all major Subjects and mediums

**ONLINE SUPPORT 24/7**
Shopping Hotline 071 777 4440

## FEATURED PRODUCTS

**SORT BY**

- GCE O/L Exam




GCE O/L EXAM, SCIENCE
O/L Science Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, MUSIC
O/L Music Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, MATHEMATICS
O/L Mathematics Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, INFORMATION & COMMUNICATION TECHNOL...
O/L Information & Communication Tec...
රු 350.00




GCE O/L EXAM, HISTORY
O/L History Past Paper Book
රු 350.00




GCE O/L EXAM, HEALTH & PHYSICAL EDUCATION
O/L Health & Physical Education Past P...
රු 350.00